# ලේන් බබා



ඊ. ඒ. සිතුනි විහස්නා එදිරිසිංහ

# ලේන් බබා

ඊ. ඒ. සිතුනි විහස්නා එදිරිසිංහ

කතෘ අයිතිය සුරකින්න

**2025 – 01 - 01**

ISBN-978-624-208-188-5

# පිදුම

මෙම පොත

අකුරු

කරන්නට

ගුරුහරුකම් දුන්

සමන්මලී ගුරු මෑණියන්ට

ආදරයෙන් පුදමි......

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිණුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේද, සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේනම්, මහමායා ඉතිහාසයද, සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමන්විත වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදී කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනඟන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද, ග්‍රන්ථකරණයට යොමු කරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වාදෙන්නට විය.

මෙම ශ්‍රාස්තීය සහ ශාසනික සේවාවන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිතුමිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම, පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

එකමත් එක රටක ලස්සන ඇත පිටිසර ගම්මානයක ගොවි ගෙදරක් තිබුණා.. මේ ගෙදර අම්මයි, දුවයි, තාත්තයි සතුටින් ආදරෙන් ජීවත් වුණා.



ඒ ගෙදර වහලය යට හරි අපූරු දෙයක් තිබුණා... මොකක්ද දන්නවාද එතැන පුංචි ලේන් කූඩුවක් තිබුණා..

ඒ කූඩුවේ ලේන් අම්මයි තාත්තායි එක්ක පුංචි ලේන් පැටියෙක් හිටියා..



ලේන් පැටියාගේ නම ටිං ටිං.. ලේන් අම්මගේ නම සූකිරි. ලේන් තාත්තා තුන්ඉරි..

උදේ වුණා.

දවල් වුණා.

රෑ වුණා.

ටිං ටිං ටික ටික ලොකු වුණා..



ඒ ගෙදර ළමයාගේ නම තිරන්දි..

තිරන්දි බබා මේ ලේන් පුංචව දැක්කා..


එයා ටිං ටිංට ආදරය කළා..



හැමදාම ටිංටිංට කතා කළා.. එක එක රස කෑම තිරන්දිගේ අම්මයි අප්පච්චියි එයාට ගේනවානේ.. තිරන්දිට ඒ කෑම වලින් කොටසක් හැමදාම ටිංටිංට දෙනවා.. මෙහෙම කාලය ගතවුණා. දෙන්නා ගොඩක් යාළු වුණා..තිරන්දි ලේන් පුංචාට බොන්න, නාන්න වතුර දෙනවා.. ටිංටිං ලොකු වුණා



එක දවසක් තිරන්දිගේ අම්මා ගොඩාක් සතුටින් කිවුවා තිරන්දි නුවර ලොකු ඉස්කොලේකට තේරිලා ලබන සතියේ නුවර යමු කියලා.. මේ ආරංචියෙන් ගෙදර අම්මයි අප්පච්චියි සතුටු වුණාට තිරන්දිට සතුට වගේම දුකකුත් හිතුණා. ඇයි දන්නවාද එයාට ටිංටිංව දාල යන්න වෙනවාට..



එත් එයාගේ අනාගතේ වෙනුවෙන් එයාට නුවර ඉස්කෝලෙට යන්නම වෙනවා.. එයා ටිංටිංගෙන් සමු අරගෙන ගියා.. හැබැයි එයා අම්මාව පොරොන්දු කර ගත්තා හැමදාම ටිංටිංව ආදරෙන් බලාගන්නවා කියලා.



තිරන්දි ඉස්කෝලේ ගිහින් නිවාඩු එනකම් ඉවසිල්ලක් නැතිව ඉන්නේ ටිංටිං බලන්න..



එක දවසක් තිරන්දි එනකොට එයා දැක්කා ටිංටිං තව යාළුවෝ එක්ක සෙල්ලම් කරනවා.. එයාට ගොඩාක් සතුටු හිතුණා. එයාට වගේම අලුත් යාළුවෝ ටිංටිං ටත් ඉන්නවා කියලා.

එයා ආයෙ දුක් වුණේ නැහැ ටිංටිං ගැන...



එයා හැම සෙනසුරාදා ම ගෙදර එනවා ටිංටිංට රස කෑමත් අරගෙන.. දෙන්නා දවසෙම සෙල්ලම් කරනවා.. තිරන්දියි ටිංටිංනුයි ගොඩාක් කාලයක් සතුටින් සිටියා....





# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත්, අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත්, සාහිත්‍ය නිර්මාණකරණය විභවතාකොට ගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීමට සහ එළි දැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව, 2014 වසරේ පටන් මගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට, ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමකි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද, සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදීශිෂ්‍යාවන් දැක්වූ කැපකිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමකි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවෙකින්වත් ලබා දිය නොහැක. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් වීමත් සමඟ, දරුවන් එයින් දුරස්වීම, අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම, සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතුවී ඇති බව පර්යේෂණාත්මකව සනාථවේ. මෙයට පිළියමක් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගාදී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛණ දිවියට මගේ සුභාශිංසනය.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනවිරත්න මහලේකම්